# <u>බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව</u>

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2008.12.24

වේලාව : පෙ.ව.11.00

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

<u>සහභාගීත්වය:-</u>

01. ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා
02. ගරු නගර සභා මන්ත්‍රී- ධර්මසේන සමරසිංහ මැතිතුමා.
03. ගරු නගර සභා මන්ත්‍රී- ර්.ජ්.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
04. ගරු නගර සභා මන්ත්‍රී- ඩබ්.ජ්. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
05. ගරු නගර සභා මන්ත්‍රී- එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
06. ගරු නගර සභා මන්ත්‍රී- එම්.ටී.එම්. රූමි මැතිතුමා

<u>සහභාගීනොවූවෝ</u>:-

01. ගරු උපසභාපති, - සුමේද චාමින්ද බස්නායක මැතිතුමා
02. ගරු නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්. විමලසේන මැතිතුමා
03. ගරු නගර සභා මන්ත්‍රී - යු.එච්. ගාමිණී මැතිතුමා

<u>නිලධාරී සහභාගීත්වය:-</u>

01. නාගරික ලේකම් - ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා

(01) <u>ආගම සිහිකිරීම:</u>

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) <u>ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:</u>

ගරු සභාපතිතුමා කථා කරමින්, අද දින පැවැත්වෙන්නේ 2008 වර්ෂයේ අවසාන සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින, ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමා හා පුවත්පත්කලාවේදී මහතුන් සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන් පැවසීය.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්තිය අර්ථවත් කරමින් ජාතික සවිය, ගම නැගුම, මග නැගුම වැඩ සටහන් යටතේ දිවයිනේ බොහෝ ප්‍රදේශවල මේ වන විට විශාල සංවර්ධනයක් සිදුව තිබෙන බව පැවසූ ගරු සභාපතිතුමා, මෙම නගර සභා බල ප්‍රදේශය තුළ ද විශාල සංවර්ධයක් සිදුව තිබෙන බවත්, තුඹගොඩ වසම තුළ පමණක් එක්කෝටි තිස් හතර ලක්ෂයක වැඩ කොටසක් ඉටුකර තිබෙන බව සතුටින් යුතුව ප්‍රකාශ කරන බව දැන්විය. අප මෙම සභාවට තේරී පත්ව මේ වන විට වසර 2 1/2 ගතව තිබෙන බවත් බවත්, මෙම කාලය දෙස ආපසු හැරී බැලීමේ දී අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් සපුරාලීමට හැකි වු බවත්, විශේෂයෙන් නව බස්නැවතුම්පල ජනතා අයිතියට පැවරීමට හැකිවීම සුවිශේෂ වු කාරණාවක් ලෙස සලකනු ලබන බව දැන්විය.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2012 වර්ෂයේ දී කසලින් තොර නිසසල පරිසරයක් ඇතිකිරිමේ තේමාව මුල්කරගෙන දිවයින පුරා විවිධ වැඩ සටහන් රැසක් ක්‍රියාවට නංවා ඇති බවත්, මෙම නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන සඳහා ලක්ෂ 78 ක මුදලක් මේ යටතේ වෙන් කර දුන් බවත්, එම මුල්‍ය ප්‍රතිපාදන මත ඉදිකරනු ලැබු නව ගොඩනැගිල්ල ගරු පාරිසරික අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා අතින් ලබන්නා වු 2009 වර්ෂයේ ජනවාරි මුල් සතියේ දී විවෘත කිරීමට අදහස් කරගෙන සිටින බවත් දැන්විය.

තවදුරටත් කථා කල ගරු සභාපතිතුමා, නෙලදර්ලන්ත ආධාර යටතේ ඉදිරි වර්ෂ 02-03 තුළදී නගරයේ ද්‍රව අප ජලය කළමනාකරණ වැඩ සටහනක් ද ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සැලසුම් මේ වන විට සකස් කෙරෙමින් පවතින බවත් දැන්විය.

නව දුරටත් කථා කල ගරු සභාපතිතුමා, ප්‍රදේශයේ ජනතාවගේ යහපත උදෙසා විදුණැන තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ජනතාව වෙත දායාද කිරීමට හැකිවීම සම්බන්ධව සතුටු විය හැකි බවත්, අන්තර්ජාල පහසුකම් ඔස්සේ මේ වන විට අප ආයතනයේ සේවාවන් පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් ද ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකර තිබෙන බැවින් ,මේ වන විට අන්තර්ජාල පරිශීලකයන්ගෙන් ඉතා යහපත් ප්‍රතිචාර අප වෙත ලැබෙමින් පවතින බවද සඳහන් කරන ලදි.

ගෙවී ගිය මෙම කාලය තුළ බදු ගෙවන ජනතාවට උපරිම සේවයක් සැලසීමට ක්‍රියාකර තිබෙන බවත්, ඒ සඳහා සහය ලබාදුන් මෙම සභාවේ ගරු උපසභාපතිතුමා, ලේකම්තුමා, කාර්යය මණ්ඩලයට සිය ස්තුතිය පිරිනමන බව දැන්විය.

යුද්ධය නිමකර සැමට සාමයෙන් සතුටින් ජිවත්වීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීමට විරෝධාර රණවිරුවන් අමිල සේවයක් ඉටුකරනු ලබන බවත්, රුදුරු ත්‍රස්තයින් පළවා හැරීමට අතිගරු ජනාධිපතුමන් ගෙන ඇති නිවැරදි නායකත්වය ඉතා අගය කරන අතර, ඒ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාට සිය ස්තුතිය පිරිනමන බවත් දැන්විය. ආරක්ෂක ලේකම්තුමා, හමුදාපතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාවට ද සභාවේ ගෞරවය හා ප්‍රණාමය පිරිනමන බව දැන්වමින්, සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලෙස ලේකම් මහතාට ආරාධනය කරන ලදී.

(03). **<u>2008.11.27 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:</u>**

පසුගිය සභා වාර්තාවේ තිරණ අංක: 03 ශිර්ෂය යටතේ "කිරිදිගල ජයන්ති ලිඳ පාර ඉතා අබලන් වී ජනතාවට ගමන් කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැවින්, එම මාර්ගය සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටින ලදි."

යනුවෙන් සඳහන්ව ඇති බවත්, එම කොටස "කිරිදිගල මැද පාර ඉතා අබලන් වී ජනතාවට ගමන් කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැවින්, එම මාර්ගය සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටින ලදි." යනුවෙන් සංශෝධනය විය යුතු බව ගරු නගර සභා මාන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් දන්වන ලදී. එම සංශෝධනයන්ට යටත්ව
2008.11.27 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **<u>පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:</u>**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවිය.

05. **<u>සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම</u>:**

05:01 **<u>විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ප්‍රදානය</u> :**

2006/2007 2007/2008 අධ්‍යයන වර්ෂවල විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති පහත නම් සඳහන් අයදුම්කරුවන් විසින් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව දන්වමින් විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති 2008.12.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

| නම | ලිපිනය | අධ්‍යයනය වර්ෂය | විශ්ව විද්‍යාලය | පාඨමාලාව |
|---|---|---|---|---|
| 01. රංගන විමුක්ති මීගස්දෙණිය | 21,සුදර්ශනපුර රාස්සගල පාර | 2007/2008 | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | කළමණාකරණ |
| 02.එච්.පී.විශාකා පියුමලී | 310/6 කිරිදිගල බළන්ගොඩ | 2007/2008 | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | කලා |
| 03.ජේ.එම්.උදේශිකා පුෂ්පා කුමාරි ජයසිංහ | නො.40/5 පෙට්ටිගල පාර, බළන්ගොඩ | 2007/2008 | පේරාදෙනිය විශ්ව විද්‍යාලය | කලා |
| 04.ඩී.එම්. සඳලි දිලේෂා දියගම | අංක:160 පෙට්ටිගල පාර, බළන්ගොඩ | 2006/2007 | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | වෛද්‍ය |
| 05.ඒ.එච්. අසංක | නො.70 වැලිහරනාව | 2006/2007 | ජයවර්ධපුර | භෞතික විද්‍යා |

| | | | | |
|---|---|---|---|---|
| ලක්මාල් | පාර,කිරිදිගල | | විශ්ව විද්‍යාලය | |
| 06.මොහොමඩ් ගනි ශකීර් අහමඩ් | මුස්තාපා මාවත,මිරිස්වත්ත,බලන්ගොඩ | 2006/2007 | රජරට විශ්ව විද්‍යාලය | වෛද්‍ය |
| 07.කාන්චනා සජානි සිසිල් | 118/4,පරණ පාර, බලගහමුල, බලන්ගොඩ | 2007/2008 | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | වෛද්‍ය |
| 08.සිංගාරවේල් කරුණයා | අංක:32/14,පල්ලිය පාර,කරවිකැටිය,බලන්ගොඩ | 2007/2008 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | කළමනාකරණ |
| 09. එම්.වින්ද්‍යා කාන්ති | සිරි නිවස බාරේ ,කිරිදිගල,බලන්ගොඩ | 2007/2008 | සබරගමුව විශ්ව විද්‍යාලය | භෞතික විද්‍යා |
| 10. ටී.ජී.නිරෝෂනි ලක්මිණි | 72/3 පරගහකුඹුර, පෙට්ටිගල පාර,බලන්ගොඩ | 2007/2008 | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | කළමනාකරණ |

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව අයවැය ලේඛනයේ වැය ශීර්ෂ 6.5.437.යටතේ ශිෂ්‍යාධාර සඳහා වෙන්කර ඇති රු100,000/- ක මුදලින් රුපියල්5,000/- බැගින් ඉහත සඳහන් අයදුම්කරුවන් වෙත ප්‍රදානය කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

## 05:02. නිවාඩු අනුමත කිරීම:

මෙම සභාවේ ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්. විමලසේන මැතිතුමා අසනීප තත්ත්වයෙන් පසුවන නිසා අද දින පැවැත්වෙන සභා රැස්වීමට සහභාගිවිය නොහැකි බව දුරකථනයෙන් දැනුම් දුන් බව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත දන්වන ලදුව, නිවාඩු අනුමත කිරීමට සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

## 05:03 වරිපනම් බදු ගෙවන ලෙස මහජනතාව දැනුවත් කිරීම:

මෙම නගර සභාවට වරිපනම් බදු ගෙවීම පැහැර හරින්නන් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු සිදුකරනු ලබන සඳහන් කරමින් සකස්කර ඇති දැන්වීමක් සභාවට ඉදිරිපත් කල අතර, සභාව මගින් නගරයේ ඉදිකර ඇති දැන්වීම් පුවරුවල එය අලවා ප්‍රසිද්ධ කිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

## 05:04 සේවා ගිවිසුමක් මත සෞඛ්‍ය පරිපාලකවරයෙකුගේ වැඩ ආවරණය කිරීමට සේවකයෙකු හා මුරකරුවකු බඳවා ගැනීම

සෞඛ්‍ය අංශයේ සේවය සඳහා සේවා ගිවිසුමක් මත බඳවාගෙන තිබූ නදීෂාන් ප්‍රදීප් මහතාට වෙනත් රැකියාවක් ලැබී මේ වන විට සේවයෙන් ඉවත්ව ඇති බැවින්, ඒ සඳහා සුදුසු අයෙකු බඳවා ගත යුතු බව යෝජනා කරමින් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව ජනවාරි මස 01 දින සිට වසරක සේවා ගිවිසුමකට යටත්ව මුරකරුවකු හා සෞඛ්‍ය කම්කරුවකු බඳවා ගැනීමට අනුමැතිය ලබාදෙන ලදී.

05:05 **බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අයකිරීම:**

බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය ලබාගෙන සිටින චන්ද්‍රවංශ සුරේන්ද්‍ර යන අය විසින් නියමිත පරිදි මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, මේ සම්බන්ධව කිහිප අවස්ථාවකදීම උපදෙස් ලබාදුන්න ද හිඟ මුදල් ගෙවීම ප්‍රමාද කර තිබෙන බවත්, මෙම අය විසින් නගරයේ රථ වාහන වලින් මුදල් එකතු කිරීම සඳහා යොදවා තිබෙන නියෝජිතයින් බීමත්ව අදාල රාජකාරියේ යෙදෙන අතර, වාහන වලින් අයකිරීමට නියමිත මුදලට වඩා වැඩි මුදලක් අයකරන බවට තොරතුරු ලැබී තිබෙන බව සඳහන් ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කළ සභාව, පුවත්පත් දැන්වීමක් පළකර මෙම සේවාවපවත්වාගෙන යාම, බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීම සුදුසු බවට තීරණය කරන ලදි.

ටෙන්ඩර් විවෘත කිරීම 2009.01.07 වන පෙ.ව.10.00 සිදුකිරීමට වැඩිදුරටත් තීරණය කරන විය.

05:06 **බෙදාහැරීම් විදුලි මාර්ග ඉදිකිරීම, හපුගස්තැන්න කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය.**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ, බුලත්ගම යන ලිපිනයේ පදිංචි ලියනගේ අබේරත්න යන අය විසින් එවා ඇති 2008.12.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බුලත්ගම හා අවට ප්‍රදේශවල ජනතාවට විදුලිය ලබාදී ඇතත්, එම විදුලි රැහැන් ඇදීමේ දී සිදු වු යම් ප්‍රමාද දෝෂයක් නිසා රැහැන් මාර්ගය අක්‍රමවත් වී තිබෙන බැවින්, ප්‍රදේශවාසී ජනතාව දුෂ්කරතා රැසකට මුහුණ පා ඇති බව එමගින් අවධාරණය කර ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

මේ කෙරෙහි සලකා බැලු සභාව, විදුලි බල මණ්ඩලයේ අදාල බලධාරීන්ගේ අවධානය මේ සඳහා යොමු කරවීමට තීරණය කරන ලදී.

05:07 **Skid Steel Loader යන්ත්‍රය සඳහා Normal Bucket Set මිළදී ගැනීම**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා මිළදීගෙන තිබෙන Bob Cat යන්ත්‍රය සඳහා දැනට භාවිත කරනු ලබන Multi Bucket එකෙන් වැඩ කිරීමේ දී නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවන බවත්, විශේෂයෙන් කසල ඉහළට එසවීම සඳහා හා කසල විසිකිරීම සඳහා එය අපහසු බවත්, එම නිසා Normal Bucket Set මිළදී ගන්නා ලෙස ඉල්ලමින්, 2008.12.02 දිනැතිව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 05:08 පිළිසරු ව්‍යාපෘතිය මගින් ඉදිකරනු ලැබූ ගොඩනැගිල්ල පාරිසරික ඇමතිතුමා අතින් විවෘත කිරීම.

උක්ත හිසින් යුතුව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති 2008.12.24 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මිලියන 7.8 ක වියදමින් බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකරනු ලැබූ නව ගොඩනැගිල්ල 2009 ජනවාරි මස මුල් සතියේ දී ගරු පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් විවෘත කිරීමට අදහස් කර තිබෙන නිසා එම උත්සවය සඳහා වන වියදම් සභාවෙන් දැරීමටත් , අවශ්‍ය නාම පුවරු කිහිපයක් නගරයේ සවිකිරීමටත් අනුමැතිය ඉල්ලා තිබිණ.

එම උත්සවය සඳහා සහ නාම පුවරු සඳහා වැයවන වියදම් සභා අරමුදලින් දැරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

### 05:09 ජී.කේ.6227 අංක දරණ ට්‍රැක්ටර් රථය:

ඉහත අංක දරණ ජෝන් ඩියර් වර්ගයේ ට්‍රැක්ටර් රථයේ ඇන්ජිමේ කලයුතු අළුත්වැඩියාව වෙනුවෙන් දේව් ට්‍රැක්ටර් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයෙන් ඉදිරිපත් කර ඇස්තමේන්තු මුදල වන රු.428,697.50 ක මුදලකට එම අළුත්වැඩියාව ඉටුකිරීමට සභාවේ අනුමැතිය පතමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති 2008.12.22 දිනැති ලිපිය සභාගත කරන ලදුව , ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 05:10 නැවත රැකියාව ලබාදෙන ලෙස ඉල්ලීම

උක්ත කරුණට අදාළව බළන්ගොඩ, බෝම්බුව, පෙට්ටිගල පාර අංක: 05 යන ලිපිනයේ පදිංචි ආර්.එම්. රම්ෂාන් යන අය විසින් එවා ඇති 2008.12.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

තමා මෙම නගර සභාවේ ආදේශක මුරකරුවකු ලෙස මාස 3 1/2 පමණ කාලයක් සේවය කළ අතර, ඒ අතරතුර සිදු වූ සිද්ධියට අදාළව බළන්ගොඩ උසාවියේ නඩුවකට පෙනී සිටීමට සිදු වූ බවත්, එම නඩුවෙන් තමා නිදහස් කල බැවින්, නැවත රැකියාව ලබාදෙන ලෙස ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදී.

නැවත සේවයෙහි පිහිටවිය නොහැකි බව සභාව විසින් තීරණය කරන ලදී.

### 05:11 ඕළුගන්තොට සුසාන භූමියේ කටයුතු පවත්වාගෙන යාම සඳහා සේවකයෙකු පත්කිරීම

මෙම නගර සභාවට අයත් ඕළුගන්තනොට සුසාන භූමිය මනා ලෙස පවත්වාගෙන යාම සඳහා සුදුසු අයෙකු පත්කරන ලෙස ඉල්ලමින් ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී. සේවා ගිවිසුමකට යටත්ව 2009.01.01 දින සිට

රු.3,000/-ක දීමනාවක් ගෙවීමේ පදනම මත සුදුසු අයෙකු සේවයෙහි යොදවා ගැනීමටත් තීරණය කල සභාව, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමටත් තීරණය කරන ලදී. මිහිදන් කිරීම සඳහා වලක් කැපීමට රු.500/- ක ගාස්තුවක් අයකිරීමට ද තීරණය විය.

05:12 **ප්‍රධාන මාර්ගයන් දෙපස ඇති ආරක්ෂිත වැටෙහි දැන්වීම් පුවරු සවිකිරීම.**

උක්ත කරුණට අදාළව, කුරුවිට එරත්න අංක: 243/ඒ/1 දරණ ලිපිනයේ පදිංචි එස්.පී. උෂාන් නදීප් දයානන්ද යන අය විසින් එවා ඇති 2008.12.24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ලංකාවේ ප්‍රධාන පෙළේ මෝටර් රථ අලෙවි ආයතනයක් වන ඒ.එම්.ඩබ්. ආයතනයේ 2'x3" ප්‍රමාණයේ දැන්වීම් පුවරු 40 ක් වසරක කාලයක් සඳහා නගර සභා බලප්‍රදේශයේ ප්‍රධාන මාර්ග දෙපස දෙපස ඇති ආරක්ෂිත වැටෙහි සවිකර ප්‍රදර්ශනය කිරීමට එමගින් අනුමැතිය ඉල්ලා තිබිණ.

මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතියට යටත්ව මේ සඳහා අවසර ලබාදීමට තීරණය කරන ලදී.

05:13 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2008**

උක්ත කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති අංක: සීඑල්ජී/2003 හා 2008.12.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2008 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණය 2009 ජනවාරි 31 දිනට පෙර කඩිනමින් පවත්වා අවසන් කිරීමට පියවර ගන්නා ලෙසත්, සමීක්ෂණ මණ්ඩලය පත්කිරීම ප්‍රාදේශීය සභා මුල්‍ය හා පරිපාලන රීති 203 ප්‍රකාරව සිදුකල යුතු අතර, සමීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට පෙර ඒ සඳහා අවශ්‍ය ලිපිලේඛණ සැකසීමට නිලධාරී මණ්ඩලය දැනුවත් කරන ලෙසත්, සමීක්ෂණය කටයුතු නියමිත කාලය තුළ අවසන් කිරීමට හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර නොගන්නා බව පසුගිය වර්ෂවලදී පැහැදිලි වී ඇති බැවින්, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කර විධිමත්ව සමීක්ෂණ කටයුතු ඉටුකරන ලෙස දන්වා ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදී.

මේ සම්බන්ධව අදාළ විෂය භාර නිලධාරිණිය දැනුවත් කිරීමට තීරණය කල සභාව, සමීක්ෂණ මණ්ඩලයේ අධීක්ෂණ සාමාජිකයින් ලෙස ගරු නගර සභා මන්ත්‍රී, ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර, ගරු නාගරික මන්ත්‍රී

ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න හා ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න යන මැතිතුමන්ලා පත්කරන ලදී.

05:14 **විදුනැණ පියස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා තාවකාලික සේවිකාවක් ලබාගැනීම.**

මෙම නගර සභාව මගින් පවත්වාගෙන යනු ලබන විදුනැණ තොරතුරු හා තාක්ෂණ මධ්‍යස්ථානයේ සේවා කටයුතු වලට සහායවීම සඳහා පරිඝනක දැනුමැති සේවිකාවක් දීමනාවක් ගෙවීමේ පදනම මත බඳවා ගැනීම සුදුසු බව සඳහන් කරමින් පරිඝනක දත්ත සටහන් ක්‍රියාකරු විසින් ඉදිරිපත් කර ඇති 2008.12.24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව සභා අරමුදලින් රු.5,000/- ක දීමනාවක් ගෙවීමේ පදනම මත සුදුසු අයෙකු බඳවා ගැනීමට තීරණය කරන ලදී.

05:15 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ගොඩනැගිල්ල ඉදිකිරීම හා පොළොව කොන්ක්‍රීට් කිරීම.

උක්ත කරුණට අදාළව සෙනුර සිවිල් ඉංජිනියර් ආයතනයේ නියෝජිත කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉහත ව්‍යාපෘතියට අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම හා පොළව කොන්ක්‍රීට් කිරීම සෙනුර සිවිල් ඉංජිනියර් ආයතනය විසින් ඉටුකර ඇති බැවින්, ඊට අදාළ මුදල් එම ආයතනය වෙත ලබාදෙන ලෙස එමගින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදී.

විධායක ඉංජිනේරු අනුමැතියට යටත්ව අවසන් ගෙවීම් මුදලින් 60% ක මුදලක් ගෙවීමට තීරණය කරන ලදී.

05:16 **දේශීය ණය අරමුදල සඳහා කාණු පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් ණය නොගෙවීම බේරුම් කිරීම:**

මේ පිළිබඳව නීතිපතිතුමන් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ පිළිබඳව මීට පෙර එකඟ වූ කරුණු මත ණය ගෙවීමට නොහැකි බවත් සභාවේ කිසිදු විමසීමකින් තොරව මෙයට අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදුකර ඇති බැවින් හා ව්‍යාපෘතිය අසාර්ථක බැවින් ණය මුදල් ගෙවීම සභාව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලදී.

05:17 **බලන්ගොඩ මහජන පොළ ඉදිකිරීම:**

බලන්ගොඩ මහජන පොළ ඉදිකිරීම පිළිබඳව දැනට ඇති තත්ත්වය පිළිබඳව වැඩ අධිකාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

බලන්ගොඩ මහජන පොළ ඉදිකිරීම පළමු අදියර කර්මාන්තයේ ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 36කි. ඇස්තමේන්තු වටිනාකම රු.27,865,341.10 කි. 2008.12.24 වන දින පැවැති ප්‍රසම්පාදන කමිටුව මගින් තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු වැඩ වටිනාකම රු.25,245,527.75 කි.ඒ අනුව, ඇස්තමේන්තු මුළු වටිනාකම රු.32,229,848.81 කි.

ඉහත සඳහන් මුදල් යෙදවීම සඳහා බළන්ගොඩ බස්නැවතුම්පල කඩ කාමර ටෙන්ඩර් කිරීමෙන් ලද මුදලින් ස්ථාවර තැන්පත් වල පවතින මුදල රු. මිලියන 30 කි. බස්නැවතුම්පල කඩ කාමර කුලී මුදල් ලංකා බැංකු ගිණුමෙහි රු. මිලියන 05 කට ආසන්න ප්‍රමාණයක් ඇත.

ඉහත සඳහන් ආකාරයෙන් මිලියන 35 ක් පමණ මුදලක් සභාවේ සතිපොළ පළමු අදියර ඉදිකිරීම සඳහා යෙදවීමට මුල්‍යමය හැකියාවක් පවතින බැවින් ඉහත සඳහන් කල ස්ථාවර තැන්පත් හා ලංකා බැංකු ගිණුමෙහි පවතින මුදල් යොදවා 2009 වසරේ කර්මාන්ත ආරම්භ කිරීමට සභාවේව අනුමැතිය පතමි.

ඉහත සඳහන් වැඩ අධිකාරී මහතාගේ වාර්තාව පිළිබඳව සලකා බලන ලද අතර, සභාවේ පවතින බස්නැවතුම්පල කඩ කාමර ටෙන්ඩර් කර ලැබුණු මුදලින් ස්ථාවර තැන්පත් වල ඇති මිලියන 30 හා ලංකා බැංකු ගිණුමේ පවතින කඩ කාමර කුලී මුදල් මිලියන 05 කට ආසන්න මුදලක් පවතින බැවින්, එම මුදල් යොදවා මහජන පොළ ඉදිකිරීම කඩිනමින් 2009 ජනවාරි මස ආරම්භ කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

- සීලගම පදිංචි එම්.ඩබ්.පී. රේණුකා ප්‍රියදර්ශනී යන අයගේ ස්වාමිපුරුෂයා අනතුරකට ලක්ව අබාධිතව සිටින අතර, ඔවුන්ට ජීවත්වීමට කිසිදු රැකියාවක් නොමැති බවත්, දියණියක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවත්, ඇයගේ අධ්‍යාපන කටයුතු සඳහා යම් උපකාරයක කරන ලෙස ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත දන්වන ලදුව, සභාපති සහ නාගරික මන්ත්‍රීවරුන්ගේ අරමුදලින් රු.5,000/- ශිෂ්‍යත්වයක් පිරිනැමීමට සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

06. <u>**මුදල් ගෙවීම් අනුමත කිරීම:** රු.10000/ - ට වැඩි ගෙවීම</u>

| | | |
|---|---|---|
| 01. | ජී.බී. කුසුමා මාලනී<br>බී.ජී.ඒ.එන්. ආනන්ද මයාගේ මරණ<br>පාරිතෝෂිකයෙන් ගෙවීම | රු. 108,433.50 |
| 02. | බී.ජී.ඒ. අයේෂා මධුශානි ආනන්ද<br>බී.ජී.ඒ.එන්. ආනන්ද මයාගේ මරණ<br>පාරිතෝෂිකයෙන් ගෙවීම | රු. 54,216.75 |
| 03. | බී.ජී.ඒ. චමිලා මධුශානි ආනන්ද<br>බී.ජී.ඒ.එන්. ආනන්ද මයාගේ මරණ<br>පාරිතෝෂිකයෙන් ගෙවීම | රු. 54,216.75 |
| 04. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක<br>එම මරණ පාරිතෝෂිකයෙන් අයවිය යුතු<br>මුදල් ගෙවීම. | රු. 62,500.00 |

| | | |
|---|---|---|
| 05. | ගැජුවට් ඉන්වෙස්ට්මන්ට් | රු. 46,802.00 |
| 06. | ඉන්දික එරික් සිසිල්<br>එස්ජී-එල්ඒ.4223 රථයෙන් බළන්ගොඩ සිට කොළඹ දක්වා ට්‍රැක්ටරයක් ප්‍රවාහනය කිරීම හා කොළඹ සිට බළන්ගොඩ දක්වා කම්බි ප්‍රවාහනය කිරීම | රු. 20,000.00 |
| 07. | සභාපති, නාගරික සමෘද්ධි බලකාය<br>බළන්ගොඩ සිටිගාඩින් පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | රු. 193,996.69 |
| 08. | කැළණි ඒජන්සිස්<br>කුමාරගම පන්සල සදහා වතුර මෝටරයක් මිළදී ගැනීම | රු. 15,840.00 |
| 09. | නිව් මල්ලිකා ගොවි සේවා<br>සෞඛ්‍ය අංශය සදහා විඩෝල් ලීටර් 12 ලබාගැනීම | රු. 20,196.00 |
| 10. | දේශානි හාඩ්වෙයාර්<br>කර්මාන්ත අංශය සදහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | රු. 18,444.79 |
| 11. | ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2008.11.03 -2008.11.13 දක්වා ඉන්ධන බිල | රු. 129,263.80 |
| 12. | මෙට්රොපොලිටන් ඔෆිස් පු.ලි.<br>පොටෝ කොපි යන්ත්‍රය අ.වැ. කිරීම. | රු. 15,812.50 |
| 13. | දේශීය ආදායම් කොමසාරිස්<br>රදවා ගැනීමේ බදු මුදල් ගෙවීම 2008 අගෝස්තු | රු. 41,182.57 |
| 14. | බී. ගුණරත්න මයා<br>2008.11.16 සිට 2008.11.30 දක්වා නගරයේ කසල එකතු කිරීම සදහා කම්කරුවන් යෙදයවීම | රු. 86,500.00 |
| 15. | දේශීය ආදායම් කොමසාරිස්, වැට් බදු අංශය<br>2008.01.01 සිට 2008.10.31 දක්වා කාල සීමාව සදහා එකතු කල අ.බ ගැනීම | රු. 117,993.00 |
| 16. | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල්පත් පියවීම -2008 ඔක්තෝබර්<br>87275/87153/88596 | රු. 16,934.08 |

| | | |
|---|---|---|
| 15. | සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා බැංකියවත්ත මළ අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ පද්ධතිය සඳහා සිමෙන්ති මිටි 100 මිළදි ගැනීම | රු. 77,500.00 |
| 16. | නිව් රෝයල් ටිම්බර් බැංකියවත්ත මළ අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මුක්කු ( දිග 10 ) හා 2x4 පොලු දිග අඩි 500 මිළදි ගැනීම | රු. 41,580.00 |
| 17. | මවුන්ට් ස්ප්‍රින්ග් වෝටර් පු.ලි. වන්නි මෙහෙයුම් නිරත රණවිරුවන්ට ද්‍රව්‍යමය ආධාර සැපයීම යටතේ ජල බඳුන් සපයා ගැනීම වෙනුවෙන් | රු. 50,000.00 |
| 18. | සභාපති, සුහද ග්‍රාම සංවර්ධන සමිතිය | රු. 73,419.43 |
| 19. | සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය ඉපිටපැත්ත ඇස්සැද්දුම මාර්ගය බැංකියවත්ත සම්බන්ධ පාර කපා බෝක්කු දමා සංවර්ධනය කිරීම කර්මාන්තයේ පළමු කොටස ගෙවීම. | රු. 251,406.37 |
| 20. | එම්.ජී.පියසේන පෞද්ගලික බස් ගාල් ගාස්තු වලින් තැන්පත් ආපසු ගෙවීම. | රු. 22,500.00 |
| 21. | ජයන්ති ටයර් සෙන්ටර් 56-1906 කෘෘ කැබ්රථයට 700x15 G.T.ටයර් 02 මිළදි ගැනීම | රු. 25,344.00 |
| 22. | ජනශක්ති ඉන්ෂුවරන්ස් 2009 වර්ෂය සඳහා වාහන ගාස්තු ගෙවීම. | රු. 16,197.82 |
| 23. | ශ්‍රී ලංකා ටෙලිකොම් නාගරික මන්ත්‍රී දුරකථන බිල්පත් පියවීම | රු. 29,612.67 |
| 24. | පතිරණ ඉලෙක්ට්‍රිකල්ස් නව තොරතුරු මධ්‍යස්ථානය හා කියවීම් ශාලාව වයරින් කිරීම සඳහා අවශ්‍ය විදුලි උපාංග මිළදි ගැනීම | රු. 51,331.52 |
| 25. | තක්සේරු නිවේදන 30,000 ක් මුද්‍රණය කිරීම-නාරා කොම්පියුටර්ස් ෆෝම්ස් | රු. 48,645.00 |

| | | |
|---|---|---|
| 26. | ජාන් කොම්පියුටර්ස් සර්විස්<br>නව තොරතුරු මධ්‍යස්ථානය සඳහා<br>පරිඝනක 08 මිළදී ගැනීම | රු. 334,640.00 |
| 27. | කළමනාකරු එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ<br>කසල කළමනාකරණ කටයුතු සඳහා<br>ගොඩනැගිල්ලක් ඉදිකිරීම කර්මාන්තයේ<br>කොන්ත්‍රාත්කරුවන්ට ලංසු කැඳවීමේ<br>නිවේදන සඳහා | රු. 26,910.00 |
| 28. | කළමණාකරු - එක්සත් ප්‍රවෘත්ති පත්‍ර<br>සමාගම.<br>බලන්ගොඩ මහජන පොළ ඉදිකිරීම<br>කර්මාන්තය සඳහා ලංසු කැඳවීමේ<br>නිවේදන සඳහා | රු. 19,406.25 |
| 29. | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>මස්කඩ ටෙන්ඩර් දැන්වීම් පළකිරීම සඳහා<br>ගෙවීම | රු. 13,972.50 |
| 30. | රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි<br>2009 වර්ෂයට ගැසට් පත්‍ර ලබාගැනීම<br>සඳහා තැපැල් ගාස්තු සමග | රු. 13,960.00 |
| 31. | සාමාන්‍යාධිකාරී - ඉඹුල්පේ විවිධ සේවා<br>සිමෙන්ති මිටි 100 මිලදී ගැනීම | රු. 77,825.00 |
| 32. | තුඹගොඩ ගොවි සංවිධානය<br>තානායම් ගෙදරවත්ත පාර ඉදිරිපිට<br>වතු නිවාස හරහා යන ගම්සභා පාර<br>සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10%<br>රැඳවුම් ආපසු ගෙවීම. | රු. 29,737.37 |
| 33. | ජේ.ජී.පී. වික්‍රමසිංහ<br>පුවත්පත් මිළදී ගැනීම වෙනුවෙන්<br>ගෙවීම. | රු. 14,665.00 |
| 34. | ඩී.එම්.චන්ද්‍රසේකර<br>නඩු අංක:2611,2321,2015,2610,2609<br>11302 නඩු වෙනුවෙන් නීතිඥ ගාස්තු<br>ගෙවීම | රු. 17,000.00 |
| 35. | පී.බී.ටයර්<br>ට්‍රැක්ටරයට රෝද 02 මිළදී ගැනීම | රු. 58,186.00 |
| 36. | ඩැක්ස් ඉංජිනියරින් කොම්පැණි<br>මීටර් පැය 750 පූර්ණ සේවාව කිරීම | රු. 30,813.10 |

37. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ දැන්වීම්
ගාස්තු රු. 15,525.00

38. නිව් ජෝති ස්ටෝර්ස්
කාර්යාලීය ලිපිද්‍රව්‍ය ලබාගැනීම රු. 30,328.65

39. ශ්‍රීලංකා ටෙලිකොම්
කාර්යාලය දුරකථන බිල පියවීම. රු. 14,423.89

40. සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා
2008.11.14 සිට 2008.11.24 දක්වා
ඉන්ධන බිල රු. 119,619.00

41. ජයන්ති ටයර් සෙන්ටර්
එන්.ජී.5124 වෑන් රථයට
215/75-15 බ්‍රිජස්ටන් ටයර් 02 මිළදී ගැනීම රු. 29,704.00

42. උපාලි එන්ටප්‍රයිසස්
බැංකියවත්ත නව ව්‍යාපෘතිය සඳහා
4 කපොලු සහිත බ්ලොක් ගල් 800 හා
කපොලු රහිත බ්ලොක්ගල් 1300 සඳහා රු. 50,290.00

43. රිචඩ් ප්‍රැන්සිස්
බැංකියවත්ත නව ව්‍යාපෘතිය සඳහා
වැලි කියුබ් 10 වෙනුවෙන් රු. 37,125.00

44. බී. ගුණරත්න මයා
2008.12.01 සිට 2008.12.15 දක්වා
කසල එකතු කිරීමේ වැටුප් ගෙවීම රු. 86,500.00

45. දිලුමිණ බිල්ඩර්ස්
තොරතුරු මධ්‍යස්ථානයට සිමෙන්ති
කැට 188 මිලදී ගැනීම රු. 12,408.00

46. ධම්මික ඉලෙක්ට්‍රිකල්ස්
කසල එකතු කිරීමේ ට්‍රැක්ටර සඳහා
සිනු සවිකිරීම. රු. 11,000.00

47. රෝයල් ටිම්බර්
බැංකියවත්ත නව ව්‍යාපෘතිය සඳහා
2x2 සපු ලෑලි දික් අඩි 1000 ලබාගැනීම රු. 19,520.00

48. විශාඛා අයිරාංගනී
එස්.කේ.බී. ශාන්ත ප්‍රනාන්දු මහතාගේ

මරණ පාරිතෝෂිකය ගෙවීම රු. 76,362.36

49. එස්.කේ.තක්ෂිලා හර්ෂනී

එස්.කේ.බී. ශාන්ත ප්‍රනාන්දු මහතාගේ
මරණ පාරිතෝෂිකය ගෙවීම රු. 38,181.17

50. එස්.කේ.එම්.ඩී. ප්‍රනාන්දු
එස්.කේ.බී. ශාන්ත ප්‍රනාන්දු මහතාගේ
මරණ පාරිතෝෂිකය ගෙවීම රු. 38,181.17

51. ගෲප්වට් ඉන්වෙස්මන්ට්
එස්.කේ.බී. ශාන්ත ප්‍රනාන්දු මහතාගේ
මරණ පාරිතෝෂිකය - ණය වාරික
අඩුකිරීම. රු. 34,500.00

52. කළමණාකරු, සමෘද්ධි බැංකු සංගමය
ආනන්ද මෛත්‍රී මාවත සිට සුදර්ශනගම
1 පටුමග සම්බන්ධ පාර කොන්ක්‍රීට් කිරීම
කර්මන්තයේ අවසන් ගෙවීම. රු.215,664.99

53. තුඹගොඩ ගොවි සංවිධනය
වෙට්නෝල් පාර ජල ටැංකිය පාර 1 පටුමග
කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ පළමු
කොටස රු.263,302.25

54. තුඹගොඩ ගොවි සංවිධානය
බැංකියවත්ත සදුන්ගම පාර කොන්ක්‍රීට්
කිරීම iii අදියර කර්මාන්තයේ 10%
රැදවුම් ගෙවීම. රු. 48,107.60

55. ඉඹුල්පේ විවිධ සේවා
2008.11.25-2008-12-10 දක්වා
ඉන්ධන බිල පියවීම. රු. 61,573.35

56. දේශීය ආදායම් කොමසාරිස්
රඳවා ලගැනීමේ බදු මුදල් ප්‍රේෂණය කිරීම
2008 සැප්තැම්බර් හා ඔක්තෝබර් රු. 34,929.03

57. ඉඹුල්පේ විවිධ සේවා
බැංකියවත්ත නව ව්‍යාපෘතිය සඳහා
සිමෙන්ති මිටි 150 මිළදී ගැනීම රු. 117,750.00

58. ජෝති ස්ටෝර්ස්
කාර්යාලිය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම. රු. 22,209.66

,
59. කේ.ජී.අජිත් අබේසුන්දර මයා
බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ

කසල කළමනාකරණ කටයුතු සඳහා
ගොඩනැගිල්ලක් ඉදිකිරීම කර්මාන්තයේ
1 කොටස ගෙවීම. රු. 897,143.78

60. දේශීය ආදායම් කොමසාරිස්
බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ
කසල කළමනාකරණ කටයුතු සඳහා
ගොඩනැගිල්ලක් ඉදිකිරීම කර්මාන්තයේ
වැට් බදු වලින් 1/3 ගෙවීම. රු. 113,459.22

61. දේශීය ආදායම් කොමසාරිස්
බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ
කසල කළමනාකරණ කටයුතු සඳහා
ගොඩනැගිල්ලක් ඉදිකිරීම කර්මාන්තයේ
රඳවා ගැනීමේ 1% රු. 22,691.84

62. ජල සම්පාදන මණ්ඩලය
නව බස් නැවතුම්පල 2008 නොවැම්බර්
ජල බිල රු. 20,586.00

63. ලංකා විදුලිබල මණ්ඩලය
2008 නොවැම්බර් විදුලිබිල රු. 69,188.00

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී

07. <u>ඇස්තමේන්තු අනුමත කිරීම:</u>
01. බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පැරණි කාණුව
සිමෙන්ති මැද පිළිසර කිරීම. රු. 78,166.41

බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ මළාපවහන කාණු පද්ධතිය සෘජු ශ්‍රමය යටතේ ඉදිකරගෙන යන බැවින්, ඉහත කී කර්මාන්තයේ ද වැඩ ඒ අතරතුර ඉටුකිරීම පහසු බැවින්, කර්මාන්තයේ වැඩ කටයුතු ආරම්භ කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් දැන්විය.

ඇස්තමේන්තුව අනුමත කල සභාව මේ සඳහා සභාවේ ආවරණ අනුමැතිය ලබාදෙන ලදී

08.1 <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ</u> : නැත

11. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා:</u> නැත

09. <u>ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම</u>:

09:01 2009 වර්ෂය සඳහා බළන්ගොඩ බස්නැවතුම්පළ හා වෙළඳ සංකීර්ණයේ පොදු වැසිකිලි නඩත්තු කිරීම හා ගාස්තු කිරීම සඳහාත්, බළන්ගොඩ නගරයේ මාර්ග අතුගෑම, කැලිකසල එකතු කිරීම, අවසාන

බැහැරලීම දක්වා ගෙන යාම හා කාණු වලින් ගොඩ දමනු ලබන පස් එකතු කිරීම, මාර්ග වල වැලි ඉවත් කිරීමේ සේවාව හා බස්නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල හා බස්නැවතුම්පල භූමිය ද ඇතුලත්ව නගර සභාව විසින් සපයනු ලබන ට්‍රැක්ටර් යොදා ගනිමින් පිරිසිදුකිරීමේ සේවාව බදු ලබාදීම සඳහා කැඳවන ලද ලංසුපත් විවෘත කිරීම මෙම අවස්ථාවේ දී සිදු කරන ලදී.

බළන්ගොඩ බස්නැවතුම්පළ හා වෙළඳ සංකීර්ණයේ පොදු වැසිකිලි නඩත්තු කිරීම හා ගාස්තු කිරීමේ සේවාව සඳහා එක් ලංසු පතක් පමණක් ඉදිරිපත් තිබූ අතර එහි මිළ ගණන් පහත දැක්වේ.

**ලංසුකරුගේ නම** **ඉදිරිපත් කල ලංසු මුදල**

01. බී.ගුණරත්න මයා
63/3,රාස්සගල පාර,බළන්ගොඩ රු.505000.00

මෙම ලංසු මුදල ඉදිරිපත් කල ඉහත කී ඉල්ලුම්කරුට එම සේවාව 2009.01.01 දින සිට 2009.12.31 දක්වා වූ කාලයට බදු ලබාදීම සුදුසු බවට තීරණය කරන ලදී.

බළන්ගොඩ නගරයේ මාර්ග අතුගෑම, කැලිකසල එකතු කිරීම, අවසාන බැහැරලීම දක්වා ගෙන යාම හා කාණු වලින් ගොඩ දමනු ලබන පස් එකතු කිරීම, මාර්ග වල වැලි ඉවත් කිරීමේ සේවාව හා බස්නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල හා බස්නැවතුම්පල භූමිය ද ඇතුළත්ව නගර සභාව විසින් සපයනු ලබන ට්‍රැක්ටර් යොදා ගනිමින් පිරිසිදුකිරීමේ

සේවාව බදු ලබාදීම සඳහා ද එක් ලංසු පතක් පමණක් ඉදිරිපත් වී තිබූ අතර, එහි මිල ගණන පහත දක්වමි.

**ලංසුකරුගේ නම** **ඉදිරිපත් කල ලංසු මුදල**

01. බී.ගුණරත්න මයා
63/3,රාස්සගල පාර,බලන්ගොඩ රු.2081000.00

මෙම ලංසු මුදල ඉදිරිපත් කල ඉහත කී ඉල්ලුම්කරුට එම සේවාව 2009.01.01 දින සිට 2009.12.31 දක්වා වූ කාලයට බදුලබාදීම සුදුසු බවට තීරණය කරන ලදී.

09:02 මෙම නගර සභාවට අයත් විදුණෑන පියස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා අඩි 10x6 ප්‍රමාණයේ 1 1/2x 1 ½ (B0X x Bar ) සමගින් නාම පුවරු 02 හා බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා අඩි 10x3 ප්‍රමාණයේ 1x1(B0X x Bar ) සමගින් නාම පුවරු 01 නිමකරවා ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිළ ගණන් විෂය භාර නිලධාරිණිය විසින් සභාවට ඉදිරිපත් කර තිබුණි.

| අයිතමය | නේත්‍රා ප්‍රින්ටින් හවුස් | මීදුම ග්‍රැෆික්ස් | සොනිටෙක් ස්ටේන්ලස් ස්ටීල් ඉංජිනියරින් |
|---|---|---|---|
| 01. අඩි 10x6 ප්‍රමාණයේ තහඩු | 48,000/- | 60,000/- | 54,000/- |
| 02. අඩි 10x3 ප්‍රමාණයේ තහඩු01 | 7,500/- | 9,000/- | 9,000/- |

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, මෙම මිල ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති "නේත්‍රා ප්‍රින්ටින් හවුස්" ආයතනය වෙතින් අදාල කාර්යය කරවා ගැනීමට තීරණය කරන ලදී.

09:03 **බළන්ගොඩ මහජන පොළ ඉදිකිරීම සඳහා2008.12.24 පැවැති ප්‍රසම්පාදන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම:**

බළන්ගොඩ මහජනපොළ ඉදිකිරීම කර්මාන්තය සඳහා කැඳවන ලද ලංසු විවෘත කිරීම 2008.09.10 දින සිදුකරන ලදී. ලංසුපත් දෙකක් ඉදිරිපත් කර තිබුණි. එහි මිළ ගණන් පහත සඳහන් කර ඇත.

| **ආයතනය:** | **ඉදිරිපත් කරන ලද ලංසු මුදල** |
|---|---|
| 01.හෙට්ටි ආරච්චි කන්ස්ට්‍රක්ෂන් අංක:876,දුන්කල සමාගම පාර | රු.24624079.25<br><br>(පීඑස් අගයන් ඉදිරිපත් කර නොතිබුණි. එම අගයන් ඉහත මුදලට එකතුවිය යුතුය.) |
| 02.සැම් ඩැම් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි නො.88, කල්තොට පාර, බළන්ගොඩ | රු.22005727.75<br>( පීඑස් අගයන් ඉදිරිපත් කර නොතිබුණි. එම අගයන් ඉහත මුදලට එකතු විය යුතුය.) |

ඉදිරිපත් කරනු ලැබූ ලංසු පිළිබඳ ඇගයීම් කමිටු වාර්තාව ලැබී ඇති අතර, එමගින් වැඩි ලංසුව ඉදිරිපත් කර ඇති හෙට්ටි ආරච්චි කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ලබාදීම සුදුසු බවට නිර්දේශ කර ඇතත්, එයින් සභාවට පාඩුවක් සිදුවන බැවින්, අවම ලංසුව ඉදිරිපත් කර ඇති බළන්ගොඩ කල්තොට පාර අංක: 88 හි සැම් ඩැම් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ආයතනය වෙත අදාල ලංසුව පිරිනැමීමට සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

10. **යෝජනා**

නැත

11. <u>කාරක සභා වල වාර්තා සලකා බැලිම</u>:

- 2008.11.01 සිට 2008.11.30 දක්වා මෙම සභාව සතු වාහන සඳහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව, සභාව විසින් එය සම්මත කරන ලදී.

12. <u>ආදායම් වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරිම:</u>

12:01 2008 නොවැම්බර් මාසයට අදාල ආදායම් හා වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම | 2699633.90 |
| වෙනත් ලැබීම් | 1305532.94 |
| | ----------- |
| මුළු ලැබීම් | 4005166.84 |
| | ======== |
| පුනරාවර්ථන වියදම් | 3914374.12 |
| වෙනත් ලැබීම් | 808564.35 |
| | ---------- |
| මුළු ගෙවීම් | 4722938.47 |
| | ======== |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

12:02 <u>**2008 - වර්ෂය පරිපුරක අයවැය:**</u>

| වැය ප්‍රතිපාදන සැලසෙන අය ශිර්ෂ | වැය ප්‍රතිපාදන අවශ්‍ය වැය ශිර්ෂ |
|---|---|
| 3.0.381 කර්මාන්ත ආධාර රු.6835980/- | 3.3.518 කර්මාන්ත රු.6835980/- |
| 1.0.361 ස්ථාවර තැන්පත් පොලි රු.2136560/- | 5.2.453 ආවශ්‍යක සේවා රු.2136560/- |
| රු.8972540/- | |

මෙම පරිපුරක අයවැය ඇස්තමේන්තුව සභාව විසින් අනුමත කරන ලදි.

13. **වෙනත් කරුණු :**

13:01 **ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් මස්සැන්න මාර්ගයෙහි කානුවක් අවහිරවීමෙන් එහි අප ජලය නාන තොටුපලකට ගලා එන බවත්, මේ සම්බන්ධව අවධානය යොමු කර එය සකස් කිරීමට පියවර ගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදී.

මෙම සභාව විසින් 2009 වර්ෂය සදහා සකස් කර ඇති අයවැය ඉතා සරලව. පහසුවෙන් කියවා ගැනීමට හැකිවන ආකාරයට සහ අලංකාරව සකස් කර ඇති බවත්, ඒ සම්බන්ධව සතුට පළකල අතර,ගරු සභාපතිතුමා, ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට තමාගේ ස්තුතිය පිරිනමන බවත් දැන්විය.

ලබන්නා වූ 2009 වර්ෂය සැමට සාමය සතුට පිරි සුභ නව වසරයක් වේවායි සුභාශිංසනය කල අතර, හෙට ලබන්නා වූ නත්තල ද ප්‍රීතිමත් සුභ නත්තලක් වේවායි ද සුභ පතමින් සිය කථාව අවසන් කරන ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී, ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, ගෙවී යන මෙම 2008 වර්ෂය තුළ බළන්ගොඩ ජනතාවට විශාල මෙහෙවරයක් ඉටුකිරීමට මෙම නගර සභාවට හැකිවීම සම්බන්ධව සිය සතුට පළමුවෙන්ම පළකර සිටින බව දැන්විය.

අතිගරු ජනාධිපතිතුමාගේ මග නැගුම,ගම නැගුම, ජාතික සවිය වැනි සංවර්ධන වැඩ සටහන් මෙවැනි සංවර්ධනයක් ක්‍රියාත්මක කිරීමට මහත් පිටිවහලක් වූ බව පැවසීය. මධ්‍යම රජයේ සහ පළාත් සභා මැති ඇමතිවරුන්ගෙන් ද සහයෝගය ලැබුණු අතර, විශේෂයෙන් සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාගෙන් ලැබුණු සහයෝගය ද කෘතඥා පූර්වකව සිහිපත් කරන අතර එතුමන්ලා සියළු දෙනාටම තමාගේ ස්තුතිය පිරිනමන බව සදහන් කරන ලදී.

මෙම සභාවේ ගරු සභාපතිතුමා ඉතා දක්ෂ කාර්යශූරු මහජන නියෝජිතයෙකු බවත්, එතුමාගේ කැපවීම හා මගපෙන්වීම මත මෙම සභාවේ ලේකම් මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ ද ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ද මත අප බලාපොරොත්තු වූ ඉලක්කයන් සපුරා ගැනීමට හැකි වූ බවත්, ඒ සම්බන්ධව සිය ස්තුතිය, ගරු සභාපතිතුමා, ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලය පළකර සිටින බව දැන්විය.

2009 වර්ෂය සදහා සකස් කර ඇති අයවැය ඉතා සාර්ථකව අලංකාරව සකස් කර ඇති බැවින්, ඒ සම්බන්ධව ගරු සභාපතිතුමා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට සිය ස්තුතිය පළකරමින් ලබන්නා වූ 2009 වසරට සුභ පැතුම් ද එක්කරමින් සිය කථාව අවසන් කරන ලදී.

13:04 ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර

ණරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් වූ මහින්ද චින්ත වැඩ සටහන යටතේ ගම නැගුම සංවර්ධනය ව්‍යාපෘතිය හරහා තමන් නියෝජනය කරනු ලබන බලන්ගොඩ තුඹගොඩ ප්‍රදේශය තුළ එක්කෝටි තිස් හතර ලක්ෂයක සංවර්ධන වැඩ ඉටුකර තිබෙන බව සතුටින් යුතුව ප්‍රකාශ කරන බව දැන්විය. රටේ සංවර්ධනය උදෙසා , මෙවැනි සංවර්ධන ව්‍යාපෘතින් ජනතාව වෙත දායාද කිරීමට අවශ්‍ය නායකත්වය ලබාදෙන අතිගරු ජනාධිපතිතුමන් වෙත තමන්ගේ ස්තූතිය පිරිනමන බවද දැන්විය. මෙම සභාවේ ගරු සභාපතිතුමාගේ උපදෙස් හා නායකත්වය මත ඉතා සාර්ථක ලෙස මෙම සංවර්ධන කාර්යයන් ඉටුකරගැනීමට හැකි වූ බවත්, ඒ සම්බන්ධව ගරු සභාපතිතුමා, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටම තමාගේ කෘතවේදීතාව පළකරමින්, ලබන්නා වූ 2009 වර්ෂයට සුභ පැතුම් ද එක්කරමින් සිය කථාව නිම කරන ලදී.

13:03 ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා:

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, අද දින පැවැත්වෙන්නේ 2008 වර්ෂයේ අවසාන සභා රැස්වීම බවත්, මෙම වර්ෂය දෙස ආපසු හැරී බැලීමේ දී බලන්ගොඩ ජනතාවට විශාල සංවර්ධනයක් ඉටුකිරීමට මෙම සභාවට හැකි වී තිබෙන බව දැන්විය.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ සටහන අර්ථවත් කරමින් ගම නැගම වැඩසටහන යටතේ බලන්ගොඩ තුඹගොඩ වසමේ එක්කෝටි තිස් හතර ලක්ෂයක් සංවර්ධනයක් ඉටුකිරීමට හැකි වූ බවත්, පැවසීය. විශේෂ ප්‍රාදේශීය නායකයින්ට මෙම ව්‍යාපෘති තුලින් මහජනතාවට අත්‍යාවශ්‍ය වූ සංවර්ධන යෝජනාවන් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදා වූ බව පැවසීය. ඒ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා ඇතුළු රජයට මෙම සභාවේ සහ නාගරික ජනතාවගේ ගෞරවය පිරිනමන බව දැන්විය.

මෙම සභාවේ ගරු සභාපතිතුමා පළාත් පාලන සංසදයේ උපසභාපති තනතුරට තේරී පත්ව ඇති බවත්, ඒ සම්බන්ධව සිය සතුට පළකරන බව දැන්විය. මෙම වර්ෂය තුල කොම්පෝස්ට් ව්‍යාපෘතියෙහි විශාල ප්‍රගතියක් පෙන්නුම් කර තිබෙන බවත්, ඒ සම්බන්ධව ගරු සභාපතිතුමා/ලේකම් මහතා/මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට තමාගේ ස්තූතිය පළකර සිටින බව දැන්විය.

මෙම සභාවේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ඉතා සහයෝගීව කටයුතු කරන බවත්, නමුත් වසර අවසාන සභා රැස්වීමට විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් සහභාගී නොවීම සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන බව දන්වන ලදි.

මෙම සභාවේ කළමණාකරණ සහකාර උදාන හේවාවිසෙන්ති මහතාට ස්ථාන මාරුවක් ලැබී ඇති බව දැනගැනීමට ඇතැයි පැවසීය. (මෙම සභාවේ සේවක පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින නිසා, මෙම නිලධාරී

මහතා මෙම ආයතනයෙන් වෙනත් ආයතනයට නිදහස් කල නොහැකි බව ගරු සභාපතිතුමා පැවසීය)

කුරිරු මීනිමරු කොටිත්‍රස්තවාදය මෙම රටින් තුරන් කර සැමට සාමය සතුටින් ජීවත්වීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අතිගරු ජනාධිපතුමාගේ නිවැරදි දේශපාලන නායකත්ව මත ආරක්ෂක ලේකම්තුමා, ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන් දිවි පරදුවට තබා විශාල මෙහෙවරයක් ඉටුකරනු ලබන බවත්, ඔවුනට මෙම සභාවේ ගෞරවණීය ස්තුතිය පිරිනමන බව දන්වමින්, ලබන්නා වූ 2009 වර්ෂය සැමටම සුභ නව වසරක් වේවා යි ප්‍රාර්ථනය කරමින් සිය කථාව අවසන් කරන ලදී.

## 14. අවසානය:

<u>ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:</u>

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රිවරුන් සියළු දෙනාටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය පුදකරමින් ලබන්නාවූ 2009 වර්ෂය සැමට සාමය ,සතුට පිරි සෞභාග්‍යමත් නවසරක් වේවා යි ප්‍රාර්ථනය කල අතර, හෙට දින ලබන්නා වූ නත්තල ද ප්‍රීතිමත් නත්තලක් වේවා යි සුභ පතමින් , ප.ව.12.45 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.